**ශීර්ෂ 184 - පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ඔක්තෝබර් 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 774.65 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 762.59 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 12.06 ක් වන අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.6 ක්ව පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 579.55 | 572.31 | 7.24 | 1.25 |
| මූලධන | 195.10 | 190.29 | 4.81 | 2.47 |
| **එකතුව** | **774.65** | **762.60** | **12.05** | **1.56** |

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18401 | 2.0 | 1.8 | 0.6 | 1.6 | 5.5 | 4.4 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 8.88 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 184 - පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් 2015 මාර්තු 31 දින වනවිට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, දින 23 ක් හා දින 55 ක් කාල පමාවකින් පසුව ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම | ගිණුම විගණනය සඳහා ලද දිනය | ප්‍රමාද කාලය දින |
|---|---|---|---|
| 184 | විසර්ජන ගිණුම | 2015.04.24 | 23 |
| 18401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | 2015.05.26 | 55 |

### 3.2 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | තොග පොත | මුදල් රෙගුලාසි 751 හා 763 |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 3.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07 ක් සඳහා රු.13,712,000 ක අධිප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.10,177,391 ක් උපයෝජනය කළ පසු ඉතිරිය රු.3,534,069 ක් වී තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 7ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාළව 2015 වර්ෂයේදී ගෙවීම් වවුචර් 5 කින් ගෙවූ එකතුව රු.166,106 ක වියදම් ඩීජීඑස්ඒ-8 දරන ආකෘතියේ දැක්වෙන බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94(1) හි දැක්වෙන විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.830,376 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 18401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී අයවීම් හිඟහිටව තිබුණු වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන එකතුව රු.105,280 ක් විය.

**3.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාවල පිටපත් 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.6 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| බස් නැවතුම්පලවල් ඉදි කිරීමේ ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ කාලය | ආරම්භ නොකිරීමට හේතුව |
|---|---|---|---|
| | රු. | | |
| වලස්මුල්ල | 40,000,000 | 2014 -දෙවන කාර්තුව | 2015 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය නොපැවැත් වීම. |
| ලුණුගම්වෙහෙර | 15,000,000 | 2014 - දෙවන කාර්තුව | |
| අකුරැස්ස | 30,000,000 | 2014 - පළමු කාර්තුව | |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | 2014 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | |
| (i) ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය | | | | | | |
| - පූඩළුඔය බස්නැවතුම්පල ඉදිකිරීම | 3,000,000 | 2013 -පළමු කාර්තුව | 2014/12/31 | නිමවී නොමැත | 2,200,000 | භූමිය පිළිබඳ ගැටළුවක් පැවතීම |
| (ii) 2015 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව දකුණු පළාත තුළ මගී ප්‍රවාහන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | | | | | | |
| - හබරාදූව බස් නැවතුම්පල ඉදිකිරීම | 20,000,000 | 2014-දෙවන කාර්තුව | 2014/12/31 | නිමවී නොමැත | 2014/12/31 දිනට මූල්‍ය ප්‍රගතියක් නොතිබුණි. | ප්‍රතිපාදන වෙන් කිරීම 2015 වර්ෂයේ දී සිදුවීම |

**3.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසයට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුනු නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.6,400 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් 2015 ජුනි 30 දින වන විටත්, මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 08 | 01 | - |
| (ii) තෘතියික මට්ටම | 01 | - | 01 | - |
| (iii) ද්විතියික මට්ටම | 57 | 28 | 29 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 15 | 16 | - | 01 |
| **එකතුව** | **82** | **52** | **31** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 31 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවකයෙකු සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.